# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 02/2023

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2023 මාර්තු මස 01 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**සාක්ෂි නොමැති, නිර්නාමික පැමිණිලි සහ විශ්වවිද්‍යාලවල පරීක්ෂණ අත්හිටුවීම පිළිබඳ පොදු විධාන/මාර්ගෝපදේශ.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, 2022.11.17 දින පැවති සිය 1090 වැනි සභාවාරයේ දී නිර්නාමික, සාක්ෂි සහිත/සාක්ෂි නොමැති පැමිණිලි පිළිබඳ පොදු විධාන/මාර්ගෝපදේශ සහ සාක්ෂි එකතු කිරීමේ මුල් අදියරේදී රහස්‍යභාවය සහතික කිරීමේ වැදගත්කම අනුමත කරන ලදී.

ඒ අනුව යෝජිත පොදු විධාන/මාර්ගෝපදේශ පහත පරිදි වේ.

| අංකය | කාරණය | ප්‍රතිචාරය |
|---|---|---|
| 1. | අනාගතයේදී ,CGEE/UGC සහ විශ්වවිද්‍යාල මගින් නවක වදය/ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ **නිර්නාමික පැමිණිලි** ඉදිරිපත් කිරීමේ/ හැසිරවීමේ/ විමර්ශනය කිරීමේ ක්‍රම. | 1. **නිර්නාමික - සාක්ෂි නොමැති පැමිණිලි**<br>පැමිණිලිකරුගේ අනන්‍යතාවය හෙළි නොකර සහ සිද්ධිය සම්බන්ධයෙන් වලංගු සාක්ෂි ඉදිරිපත් නොකර ගොනු කරනු ලබන පැමිණිලි **විභාග කළ නොහැකි බව** කරුණාවෙන් සලකන්න.<br><br>2. **නිර්නාමික - වලංගු සාක්ෂි සහිත පැමිණිලි**<br>පැමිණිලිකරුගේ අනන්‍යතාවය හෙළි නොකර, එහෙත් සිද්ධිය සම්බන්ධයෙන් වලංගු සාක්ෂි ඉදිරිපත් කරනු ලබන පැමිණිලි **විභාග කළ හැකි බව** කරුණාවෙන් සලකන්න. |

| | | |
|---|---|---|
| 2. | පරීක්ෂණ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මූලිකවම සාක්ෂි එකතු කිරීමේ අදියරේදී **රහස්‍යභාවය පවත්වා ගැනීමේ වැදගත්කම** පිළිබඳව විශ්වවිද්‍යාල වෙත මගපෙන්වීම. | **රහස්‍යභාවය පවත්වා ගැනීමේ වැදගත්කම**<br><br>සිදුවීම්වලට සම්බන්ධ පාර්ශ්වයන්ගේ පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය සහතික කරන අතරම සන්දර්භය/අවස්ථාව මත පදනම්ව තොරතුරු රැස් කිරීමේදී සුදුසු ප්‍රවේශයන් අනුගමනය කිරීමට යෝජනා කෙරේ.<br><br>තවද, පැමිණිල්ල/පැමිණිල්ලි හා පැමිණිලිකරු /පැමිණිලිකරුවන්ගේ පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය, විමර්ශන ක්‍රියාවලිය පුරාවටම මෙන්ම සිද්ධිය/කාර්යය හෝ විමර්ශනය අවසන් කිරීමෙන් පසුව ද පවත්වාගෙන යා යුතුය. |

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ.කළේ. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති

පිටපත් :

1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
7. පීඨාධිපතිවරුන්
8. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්

13.ප්‍රධාන අභ්‍යන්තර විගණක/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්

15.උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්

16.වෘත්තීය සමිති ලේකම්වරුන්

17.විගණකාධිපති

ලිපි ගොනු අංක: UGC/CGEE/PO_D-01